# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2030/18 – 2017 අගෝස්තු මස 01 වැනි අඟහරුවාදා – 2017.08.01

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක: අයිආර්/කොම්/01/වී/2015/116.

### කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2017.02.22 දිනැති හා අංක 2007/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.12.05 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මාලඹේ, පොතුආරාව පාර, අංක 1034/2/එන් හි පදිංචි ඩී.ඒ.පෙරේරා මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් නුගේගොඩ, තලපත්පිටිය හි පිහිටි ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.06.16 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ.විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල් *(වැඩ බලන)*.

2017 ජූලි මස 24 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කාර්මික අධිකරණයේ දී ය

ඩී.ඒ. පෙරේරා මයා,
අංක 1034/2/N,
පොතුආරාව පාර,
මාලබේ.

සහ

*නඩු අංකය* : A/13/2017

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලය,
තලපත්පිටිය.
නුගේගොඩ,

අතර පවත්නා කාර්මික ආරාවුල,


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයාට පැවරී ඇති බලතල යටතේ ඉහත පාර්ශ්වයන් දෙක අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා අමාත්‍යවරයා විසින් 2016.12.05 වැනි දින මා වෙත යොමු කරන ලදී.

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වැඩ බලන ගණකාධිකාරී ඩී.ඒ. පෙරේරා මහතා විසින් කාර්මික අධිකරණයෙන් ඉල්ලා සිටින ලද්දේ එම රෝහලේ පාලන අධිකාරිය 2014 ජූලි මස 23 වැනි දින පනවන ලද විනය නියෝගයකින් ඔහුගේ වාර්ෂික වැටුප් වර්ධක රු. 5 අඩු කිරීම, සියලු උසස්වීම් නතර කිරීම, රුපියල් 30,000/- ක මුදලක් අය කිරීම, වැඩ බලන ගණකාධිකාරී තනතුරින් පහ කිරීම හා ඉහත දඬුවම් 2012 සිට ක්‍රියාත්මක කිරීම සිදු කරන ලද බවත්, එම විනය නියෝගය සම්බන්ධයෙන් සාධාරණ වියදමක් ලබාදෙන ලෙසය.

ඒ අනුව ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතුව පවත්නා කරුණ වූයේ 1983 අංක 54 පනතින් සංස්ථාපිත ශ්‍රී ජයවර්ධනපුර මහරෝගාශාලා මණ්ඩලය යටතේ පාලනය වන ශ්‍රී ජයවර්ධනපුර මහරෝග්‍ය ශාලාවේ 2001.10.15 වැනි දින සිට සහකාර ගණකාධිකාරී ලෙස සේවය කරන ඩී.ඒ. පෙරේරා මහතාට විරුද්ධව පැවති විනය පරීක්ෂණය අනුව 2014 ජූලි මස 23 දිනැතිව ලබාදී ඇති විනය නියෝගය යුක්ති සහගතද යන්න හා එලෙස යුක්ති සහගත නොවන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්නයි.

ඒ අනුව කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරී විසින් ආරවුලට හේතු වී ඇති කරුණු පිළිබඳව ඉදිරිපත් කළ හැකි විස්තර ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙස 2017.03.08 වැනි දින දෙපාර්ශ්වයට දැනුම් දෙන ලදී. ඒ අනුව ඉල්ලුම්කාර ඩී.ඒ. පෙරේරා මහතා විසින් ද ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය සුසිත සේනාරත්න මහතා විසින් ද ආරවුලට අදාළ විස්තර ප්‍රකාශ මෙම අධිකරණයට ගොනු කරන ලදී. අනතුරුව මෙම නඩුව 2017.05.06 වැනි දින විභාගයට ගැනීමට නියමිතව තිබුණි. එසේ තිබියදී 2017.05.06 වන දින ඉල්ලුම්කාර ඩී.ඒ. පෙරේරා මහතා කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරී වෙත ලිපියක් යොමු කරමින් විදේශ රටක රැකියාවකට රටින් බැහැරවීමට තීරණය කිරීම නිසා මෙම ආරවුල සමථයකට පත් කර ගැනීමේ අධිකරණ ක්‍රියාවලියකට ඉදිරියේදී සහභාගී වීමට නොහැකි බැවින් බේරුම් කර ගැනිමේඅදහස ඉල්ලා අස්කර ගන්නා බව දන්වා ඇත. ඒ අනුව ඉල්ලුම්කරුගේ ඉල්ලීමට ඉඩදී මෙම නඩුවේ කටයුතු අවසන් කරමි. මා වෙත යොමු කරන ලද කාර්මික ආරවුලට හේතුවූ කාරණය සම්බන්ධයෙන් තීරණයක් නොකරන අතර, ප්‍රදානයක්ද නියම නොකරමි.

**නීතිඥ සරත් ලියනගේ (බී.ඒ.),**
බේරුම්කරු.

**2017 ජුනි මස 16 වැනි දින**

08-592

---

මගේ අංකය: T23/CO/12/2003.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2010.11.25 දිනැති හා අංක 1681/37 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2010.11.05 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් රාජගිරිය, නාවල පාර, අංක 403 හි පදිංචි ඩබ්. නීල්වල මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 01, මුදලිගේ මාවත, අංක 28 හි පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.03.24 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**ඒ.විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල් *(වැඩ බලන).*

2017 ජූලි මස 20 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ කාර්මික අධිකරණයේ දී ය

ඩබ්ලිව්. නීල්වල මයා,
අංක 403,
නාවල පාර,
රාජගිරිය.

ඉල්ලුම්කරු

එදිරිව

නඩු අංකයඃ ඒ/3362

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,
අංක 28,
මුදලිගේ මාවත,
කොළඹ 01.

වගඋත්තරකරු

අතර පවත්නා කාර්මික ආරවුල සම්බන්ධවයි.

**තීන්දුව හා ප්‍රදනය**

ඉහත අංක දරන නඩුවේ කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍ය ගරු ගාමිණි ලොකුගේ මැතිතුමාගේ අංක T23/CO/12/2003 සහ 2010-11-15 දිනැති ලිපිය මගින් එකී ගරු අමාත්‍ය ගාමිණි ලොකුගේ මහතා හට 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව බේරුම්කිරිමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පහත නම් සඳහන් මා පත් කර ඇත.

2. එකී ආරවුල සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්ගේ අංක T 23/CO/12/2003හා 2010 ඔක්තොම්බර් මස 20 දිනැති ලිපිය මගින් ඉහත කී කාර්මික ආරවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

(1). ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව යටතේ 1996 ජූලි මස 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගබඩා නිලධාරි තනතුරට පත්කරනු ලැබූ ඩබ්ලිව්. නිල්වල මහතාට එම පත්වීමේ දින සිට එකී තනතුරට අදාළ රු 9475/- (රුපියල් නමදාස් හාරසිය හැත්තෑ පහ)ක වැටුප් තලය මත පිහිටුවන ලෙසට ඔහු විසින් කරන ලද ඉල්ලීම යුක්තිසහගතද යන්න හා නොඑසේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද? යන්න හා

(2). 2004 හා 2006 යන වර්ෂයන් සඳහා රජයේ අයවැය මගින් ප්‍රතිශෝධිත වැටුප් වැඩිවීම් ලබා දෙන ලෙසට ඩබ්ලිව්. නිල්වල මහතා විසින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙතින් කරන ඉල්ලීම යුක්තිසහගතද යන්න හා නොඑසේනම් ඔහුට කුමන සහනයක් හිමිද යන්න පිළිබඳවද වේ යනුවෙන් දක්වා ඇත.

3. මෙම ආරවුල සම්බන්ධයෙන් දෙපාර්ශවය විසින් පළමු ප්‍රකාශ හා දෙවන ප්‍රකාශ ගොනු කිරීමෙන් පසු ආරවුල බේරුම්කිරිමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරණය විසින් උත්සහ කලද එය අසාර්ථක වීම නිසා නඩුව විභාගයට ගන්නා ලදි.

4. ඉල්ලුම්කාර පාර්ශ්වයට නඩුව ආරම්භ කරන ලෙසට 2011 දෙසැම්බර් 07 වන දින බේරුම්කරණය විසින් නියෝග කරන ලදින් ඉල්ලුම්කාර පාර්ශවය විසින් තම මූලික සාක්ෂි ලබාදෙන ලදි.

5. ඉන් අනතුරුව 2012 ජූලි මස 26 වන දින වගඋත්තරකාර සංස්ථාව වෙනුවෙන් පෙනී සිටින නීතිඥ මහතා මෙම නඩුව විභාගයට යන අතරතුරසමථයක් ඇතිකර ගැනිමට හැකි වුවහොත් ඒ බව බේරුම්කාර අධිකරණය වෙත දැනුම් දෙන බවට ප්‍රකාශ කල අතර නඩු විභාගය යලිත් ආරම්භ කරමින් ඉල්ලුම්කරුගෙන් වැඩිදුර මූලික සාක්ෂි විමසීම් සිදුකරන ලදි.

6. නඩු විභාගයේදී ඒ 23 දක්වා ලේඛන ලකුණු කළ ඉල්ලුම්කරු හරස් ප්‍රශ්න වලට ලක්වී තිබූ අතර 2015 ජුනි 24 වන දින නඩුව සඳහා ඉල්ලුම්කරු පැමිණි නැති අතර ඔහු වෙනුවෙන් නියෝජනයක්ද තිබී නැත. එදින මෙම නඩුව සඳහා වගඋත්තරකාර ආයතනයේ කිසිවකු පැමිණ නැති අතර වගඋත්තරකාර සංස්ථාව වෙනුවෙන් නීතිඥ ඩිශාන් ධර්මසේන මහතා පෙනී සිට ඇත. මෙහිදි අධිකරණය විසින් මෙම නඩුව 2015 ජුනි 12 වන දින පැවැති අවස්ථාවේදී මීලඟ දින මෙම නඩුවට ඉල්ලුම්කරු

සාධාරණ හේතුවක් රහිතව නොපැමිණියහොත් නඩුව නිශ්ප්‍රභා කරන බවට ඉල්ලුම්කරුට දන්වන ලෙසට කාර්මික අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාට බේරුම්කරණය විසින් නියෝග කර ඇත. ඒ අනුව ඊදින කාර්යය සටහන් වල පිටපතක් ද සතියක් ඇතුළත ඉල්ලුම්කරුට යවන ලෙසටද රෙජිස්ට්‍රාර්වරයාට නියෝග කර ඇත. ඒ අනුව 2015 ජූනි 17 දාතම ලියාපදිංචි ලිපිය මගින් ලියාපදිංචි තැපැලෙන් ඉහත කී නියෝගය කාර්මික අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව මෙම නඩුව 2015 ජූනි 24 වන දින බේරුම්කරණය විසින් නිශ්ප්‍රභා කර ඇත. මේ අතර ඉල්ලුම්කරුගේ 2015 ජූනි 03 වැනි දින දරන ලිපිය මගින් අසනීප තත්වය මත ඉදිරියේදී මෙම නඩුවට පෙනී සිටිමට අපහසු බවද කාර්මික අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාට දන්වා ඇත.

7. මේ අනුව ඉහත කී කාර්මික ආරවුල සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ ඉල්ලුම්පත්‍රය බේරුම්කරණය විසින් නිශ්ප්‍රභා කර ඇති හෙයින් ප්‍රදානයක් ලබා නොදීමට තීරණය කරමි.

8. මෙය සාධාරණ හා යුක්තිසහගත තීන්දුවක් කොට මම සලකමි.

**පී. දනන්සූරිය,**
බේරුම්කරු.

2017 මාර්තු මස 24 වැනි දින,
කොළඹදී.

08 – 593

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.